# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.19 පැය 0755 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /776/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**<u>පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2025.04.18 වන දින දහවල් කාලයේ කොහුවල පොලිස් වසමේ බෝධියවත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩාමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 14 මිලි ග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැක කරන මුදල් රුපියල් 13,700/- ක්** සමඟ අත්අඩංගුවට ගෙන කොහුවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොහුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් වැලි ප්‍රවාහන කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා මාන්කුලම් කඳවුර.**

2025.04.18 වන දින දහවල් කාලයේ මල්ලාවී පොලිස් වසමේ කල්විලයාන්කුලම් ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා මාන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව වැලි කියුබ් 03 ¼ ක් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ට්‍රැක්ටර් රථයද සමඟින් සමඟින් අත්අඩංගුවට ගෙන මල්ලාවී පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන යෝගපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මල්ලාවී පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා වාකරේ කඳවුර.**

2025.04.18 වන දින සවස් කාලයේ හා 2025.04.19 වන දින අළුයම් කාලයේ වාකරේ පොලිස් වසමේ මාටුපට්ඩිතුරෙ හා කදිරවේලි ප්‍රදේශවලදී පොලිස් විශේෂ කාර්‍ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන් කණ්ඩාමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 20 ක්, බැරල් 01 ක් හා බූලී 01 ක් සමඟ සැකකරුවෙකු හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 140 ක්, බැරල් 01 ක් හා තඹ දඟරයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වාකරේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 51 වයස්වල පසුවන කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වාකරේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. නීති විරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුර.**

2025.04.18 වන දින සවස් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ ශ්‍රාවස්තිපුර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩාමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 03 මිලි ලීටර් 750 ක්, නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ලද ගෝඩා ලීටර් 180 ක්, තඹ දඟරයක් හා යකඩ බැරල් 01 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අනුරාධපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන ශ්‍රාවස්තිපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර.**

2025.04.18 වන දින සවස් කාලයේ පුල්මුඩේ පොලිස් වසමේ ජින්නානගර් ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර තීරු බදු නොගෙවා මෙරටට ගෙන්වන ලද දුම්වැටි 200 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුල්මුඩේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන පුල්මුඩේ 04 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුල්මුඩේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. රජයේ රක්ෂිත ප්‍රදේශයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2025.04.18 වන දින සවස් කාලයේ සේරුනුවර පොලිස් වසමේ ත්‍රිකෝණමඩු රක්ෂිත ප්‍රදේශයේ විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර රජයේ රක්ෂිතයට ඇතුලු වී අක්කර ¾ ක පමණ කැලෑ ප්‍රදේශයක් ලෝඩර් යන්ත්‍රයක් භාවිතා කරමින් එළි පෙහෙළි කල සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සේරුනුවර වන සත්ව අඩවි ආරක්ෂක කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන සෝමපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සේරුනුවර වන සත්ව අඩවි ආරක්ෂක කාර්යාලය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

වැටලීමට අදාල ඡායාරූප කිහිපයක් මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**